# සාම්ප්‍රදායික, සුළු කර්මාන්ත තිරසාර සංවර්ධනයට දායක කරගත හැක්කේ කෙසේ ද?

**ටී.එච්.ජී.ජ්.කේ. ජයසූරිය**
පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයන අංශය,
සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්ව විද්‍යාලය, මිහින්තලේ.
*Anushajayasooriya1@gmail.com*

ප්‍රමුඛ පද : දියතරිප්පු, නීලවල ආභරණ, තිරසාර සංවර්ධනය

ශ්‍රී ලංකේය ඉතිහාසයේ ගම්පළ හා මහනුවර අවධිවල දී ග්‍රාමීය සමාජවල ස්වභාවික අමුද්‍රව්‍ය යොදා ගනිමින් කරන ලද විවිධ කර්මාන්ත මේ වන විට වසර 400ක් පමණ පැරණි මධ්‍යකාලීන සුලු කලාශිල්ප වශයෙන් හඳුනාගත හැකි වේ. ලාක්ෂා, දියතරිප්පු, පිත්තල ආදි කර්මාන්ත මෙයට අයත් වේ. මේවායේ නියැලෙන්නන් කර්මාන්ත අනුව විවිධ කුලවලට බෙදීම කළ අතර එම කර්මාන්ත තම ජීවනෝපාය මාර්ග වූ අතර මහාපරිමාණ කර්මාන්ත නොවී ය. නමුත් ඒවා තුළින් නිර්මාණ ශිල්පියාගේ ශිල්පීය දැනුම, තාක්ෂණය, අනන්‍යතාව ආදි කරුණු ගම්‍යමාන වේ. මෙම කලාශිල්ප සමකාලීන සමාජ, ආර්ථික, පාරිසරික හා ආගමික තත්වයන් සමඟ බද්ධ ව පවතින අතර එකල පැවති ස්වයංපෝෂිත අර්ථ ක්‍රමයට මනා දායකත්වයක් ලබා දෙන ලදී. පුරාවිද්‍යාත්මක ව ගත් කළ මෙම කර්මාන්ත ආශ්‍රිත තාක්ෂණය අස්පර්ශිත උරුමය වශයෙන් ද නිපද වන ලද නිර්මාණ ස්පර්ශිත උරුමය වශයෙන් ද හඳුනාගත හැකි වේ. වර්තමානය වන විට නාගරීකරණය, අවිධිමත් කළමනාකරණය, කුල ක්‍රමය, වර්තමාන සමාජ ආර්ථ ක්‍රමය, වෙළෙඳපොළ තත්වය පහළ බැසීම, ආදේශක ද්‍රව්‍ය, අමුද්‍රව්‍ය දුලභත්වය හා රැස්කර ගැනීමේ අසීරු බව යන කරුණු නිසාවෙන් මෙම සාම්ප්‍රදායික කර්මාන්ත පරිහානියට ලක් වී ඇත. නමුත් මෙම කර්මාන්ත තව දුරටත් ආරක්ෂා කර ඉදිරියට පවත්වාගෙන යාම හා අනාගත පරම්පරාවන් උදෙසා සම්ප්‍රේෂණය කිරීම කළ යුතුවේ. ඒ සඳහා මනා ප්‍රවේශයක් තිරසාර සංවර්ධනය හා මෙම කර්මාන්තයන් සම්බන්ධ කිරීම මගින් ලබා ගත හැකි ය.

උඩුනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කිරිවවුල දියතරිප්පු කර්මාන්තය හා පාතහේවාහැට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නීලවල ආභරණ කර්මාන්තය ඇසුරින් තිරසාර සංවර්ධනයේ දිශානතීන් සඳහා මෙම සාම්ප්‍රධායික කර්මාන්ත පාදක කරගත හැකි ආකාරය පිළිබඳ

ව අධ්‍යයනය කිරීම මුඛ්‍ය අරමුණ වේ. එහි දී පුස්තකාල හා ක්ෂේත්‍ර අධ්‍යයනය යන අධ්‍යයන ක්‍රමවේද යොදා ගනු ලබන අතර ක්ෂේත්‍ර අධ්‍යයනයේ දී කළ මානවවංශ අධ්‍යයනයේ කරුණු පාදක කරගනු ලැබේ.

මතු පරපුරවල අපේක්ෂාවන් හා අරමුණු ඉටුකර ගැනීමට ඉඩ සැළසෙන පරිදි වත්මන් පරපුරෙහි අවශ්‍යතාවන් ඉටුකර ගැනීමේ ක්‍රියාවලිය ආශ්‍රිත සංවර්ධනය තිරසර සංවර්ධනය යි. පවත්නා සම්පත් තත්කාලීන අවශ්‍යතා උදෙසා පාදක කර ගනිමින් එම සම්පත් අනාගතය වෙනුවෙන් ආරක්ෂා කර පවත්වාගෙන යාම මෙහි මූලික අරමුණ වී ඇති බව පැහැදිලි ය. අතීත ලාංකේය සමාජය තුළ මිනිසා හා පරිසරය අතර හා මිනිසා මිනිසා අතර පැවති සම්බන්ධතාවන් හේතුවෙන් පැවති සියලුම සම්පත් පරිසර හිතකාමී අයුරින් තම අවශ්‍යතා උදෙසා භාවිත කරන්නට ඇත. එහි මූලික අවස්ථාවක් ලෙසින් මධ්‍ය කාලීන සුලු කලාශිල්ප දැක්විය හැකි ය. ඒ තුළින් ස්වභාවික අමුද්‍රව්‍ය ආශ්‍රයෙන් මිනිසාට හිතකර විවිධ වූ නිර්මාණයන් නිපදවා ඔවුනගේ අවශ්‍යතා උදෙසා භාවිත කරන්නට ඇත. අතීත ලංකා සමාජ සංස්කෘතිය තුළ මිනිසා දැනුවත්ව හෝ නොදැනුවත්ව තිරසර සංවර්ධනය නම් සංකල්පය ක්‍රියාත්මක කරන්නට ඇති බව මේ අනුව පැහැදිලි ය. පුරාවිද්‍යාව නම් විෂය තිරසාර සංවර්ධනය හා සම්බන්ධ කර ගැනීමේ දී සංස්කෘතික උරුමය තිරසාර සංවර්ධනයේ ගාමක බලවේගය ලෙස දැක්විය හැකි වේ. පුරාවිද්‍යාත්මක උරුමයක් වන මෙම සාම්ප්‍රධායික සුළු කර්මාන්ත පරිහානියට පත්වීම පාලනය කරමින් තව දුරටත් පවත්වාගෙන යාම සඳහා මෙම කර්මාන්ත සංවර්ධනය කරමින් තිරසාර සංවර්ධනය උදෙසා යොදා ගැනීම කළ හැකි වේ.

උක්ත සාම්ප්‍රධායික කර්මාන්තයන් ද්විත්වය තිරසර සංවර්ධනය හා පාදක කරගත හැකි ආකාරය විමර්ශනය කිරීමේ දී ප්‍රධාන වශයෙන් එම කර්මාන්තයන්ගේ ඓතිහාසිකත්වය, තාක්ෂණය, උපකරණ භාවිතය හා අමුද්‍රව්‍ය භාවිතය හා වර්තමාන තත්වය ආදිය කෙරෙහි අවධානය යොමු කළ යුතු වේ. ඒ තුළින් ලබා ගන්නා අවබෝධය මගින් ගතයුතු කියාමාර්ග තීරණය කළ හැකි නිසාවෙනි. දියතරිප්පු කර්මාන්තය ගම්පළ රාජධානි සමයේ පටන් පැවත එනු ලබන දියතරිප්පු හෙවත් පළිගු නම් අර්ධ මාණික්‍යමය පාෂාණය යොදා ගනිමින් සාම්ප්‍රධායික උපකරණ හා නිෂ්පාදන ක්‍රියාවලියක් යටතේ පවත්වාගෙන යනු ලබන කර්මාන්තයක් ලෙස හඳුනා ගත හැකි ය. ඇස් කණ්නාඩි, මාල, පෙන්ඩන්ට් හා චූඩාමාණික්‍ය මේ මගින් නිපදවන නිර්මාණයන් වේ. ඒ සඳහා පට්ටලය, අල්ලුව, ඔට්ටුගල, ඔපදමන ලීය, කපන යකඩ රෝද හා වර්තමානයේ විද්‍යුත් මෝටරය යන උපකරණ භාවිත කරනු ලබන අතර අවශ්‍ය අමුද්‍රව්‍ය රත්නපුර, කුරුවිට ආදී දුර බැහැර ප්‍රදේශවලින් ගෙනඑන බව දැක් වේ.

රිදී ප්‍රධාන අමුද්‍රව්‍ය සේ යොදා ගනිමින් 2වන රාජසිංහ රජු විසින් උඩගෙදර කිරුංගප්පු මූලාචාරියා නම් ශිල්පියාට ගම්වරයක් වශයෙන් ප්‍රධානය කළා වූ ගමක් නීලවල නම් ගමෙහි පවතින ආභරණ කලාව අරිබු සුරුළු ලෙසින් හඳුන්වන සූක්ෂම හා දුර්ලභ කලාවක් වන අතර ඒ මගින් සිරිබෝ මාල, ලූණු මල් මාල හා වළලු, අගස්ති මාල හා වළලු, තාලි මාල, පදක්කම් හා වෙනත් මාල වැනි ආභරණ අඩු, මිටි, පීර, දුනු කියත, සිඳුරු පත හා පොඩි වෙට්ටුව ආදී සාම්ප්‍රදායික උපකරණ භාවිතයෙන් නිර්මාණය කරනු ලබන අතර සාම්ප්‍රදායික ශිල්ප ක්‍රම භාවිත කරනු ලැබේ.

වර්තමානයේ දී මෙම කර්මාන්ත ආශ්‍රිතව අතීතයේ පැවතියා මෙන් වර්ධනයක් නොව පරිහානි තත්වයක් පවතින බව හඳුනාගත හැකි විය. මන්ද දේශීය ජනතාව මෙම කර්මාන්තයන් හා ඒවා මගින් නිපදවන උපකරණ හා ඒවායේ උපයෝගීතාව පිළිබඳ ව ඇති නොදැනුවත්කම හා නොසැළකිලිමත් බව, කාර්මීකරණය හා වාණිජකරණය, විවිධ විදේශීය ආදේශන භාණ්ඩ භාවිතය ආදී තත්වයන් මෙන් ම ඉහත දක්වා ඇති විවිධ හේතු නිසාවෙන් මෙම ශිල්පීය පරම්පරාවන් එම කර්මාන්තවලින් බැහැරව වෙනත් රැකියාවල නිරත වීම හා වෙළෙඳපොළ තත්වය නිසාවෙන් මෙම කර්මාන්ත පරිහානියට පත් වී ඇති බව පැහැදිළි විය.

මෙහි දී ලංකාවේ පවතින සමාජ ආර්ථික තත්වයට යෝග්‍ය වන ආකාරයෙන් එම කර්මාන්තවල සාම්ප්‍රදායිකත්වය, ආවේණිකත්වය, පැරණි බව, අනන්‍යතාව හා නිර්මාණයන්හි ගුණාත්මක බව ආදිය කෙරෙහි හානියක් නොවන පරිදි සංවර්ධනය කර තිරසාර සංවර්ධනයේ ආර්ථික, මානව අයිතීන් ලබා දීම, සාම්ප්‍රධායික මිනිසුන්ගේ දැනුම ආරක්ෂා කිරිම ආදී දිශානතීන් කෙරෙහි අවස්ථාව ලබා දීම කළ හැකි වේ. මෙම කර්මාන්ත විධිමත් ව අධ්‍යයන කරමින් ඒ ආශ්‍රිත තාක්ෂණය හා ශිල්ප ඥානය හඳුනාගනිමින් ඒ පිළිබඳ දේශීය ජනතාව දැනුවත් කිරීම, එම කර්මාන්තවල නියැලෙන ජනතාවගේ දිළිඳුකම තුරන් කිරීම උදෙසා ඔවුන් දිරි ගැන්වීම/ විවිධ දීමනා ලබා දීම හා වර්තමාන සමාජය තුළ ඔවුනට යම් තත්වයක් සකස් කරලීමට අවශ්‍ය පියවර ගැනීම, භාණ්ඩවල වෙළෙඳපළ තත්වය ඉහළ දැමීම හා ඒවායේ පරිසර හා මානව හිතවාදී උපයෝගීතාව පිළිබඳ දැනුම ලබා දීම, පාරම්පරික ශිල්ප කර්මාන්ත ආශ්‍රිත දැනුම අනාගත පරපුර උදෙසා සම්ප්‍රේෂණය කිරීමට අවශ්‍ය පියවර ගැනීම හා වර්තමාන සමාජ සංස්කෘතිය හා උපයෝගීතාව අනුව පැරණි අමුද්‍රව්‍ය/ උපකරණ හා තාක්ෂණය යොදා ගනිමින් නව නිර්මාණ සිදු කිරීම හා ඒ සඳහා අවශ්‍ය පසුබිම සකස් කරලීම ආදීය මගින් මෙම කර්මාන්ත තිරසර සංවර්ධනය හා සම්බන්ධ කිරීම කළහැකි වේ. මේ මගින් වර්තමාන සමාජ අර්ථක්‍රමය තුළ කාර්මීකරණය හා වාණිජකරණය නිසාවෙන් මෙහි දී

නිපදවන භාණ්ඩවල ගුණාත්මක බව පිහිරීම, සාම්ප්‍රධායික උපකරණ හා ශිල්පීය ක්‍රම භාවිත නොකිරීම ආදී තත්වයන් ද පාලනය කරමින් ලාංකේය සාම්ප්‍රදායික කර්මාන්තයන් පවතින ස්වභාවික සම්පත් උපයෝගී කර ගනිමින් විධිමත්ව පවත්වාගෙන යාමෙන් උරුමය තිරසාර නොකර තිරසාර සංවර්ධනය උදෙසා මෙම කර්මාන්ත දායක කරගත හැකි බව නිගමනය කළ හැකි වේ. ඒ මගින් මෙරට දේශීය ආර්ථිකය සංවර්ධනය වෙමින් සාම්ප්‍රධායික තාක්ෂණය ද වර්ධනය වෙමින් අනාගතය උදෙසා ද එම කර්මාන්තයන් සම්ප්‍රේෂණය කළ හැකි බව ද දැක්විය හැකි ය.

**පරිශීලන**


කුමාරස්වාමි, ඒ.කේ., මධ්‍ය කාලීන සිංහල කලා, ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව, 1962

ජයකොඩි, සරත් කේ. ශ්‍රී ලංකාවː තිරසර සංවර්ධනය, අභියෝග සහ ප්‍රතිචාර, කතෘ ප්‍රකාශන, 2008

තිලකසිරි, ජයදේව, ශ්‍රී ලංකාවේ පාරම්පරික ශිල්පි ගම් හා පාරම්පරික ශිල්පීන්ගෙන් පැවත එන පවුල් පිළිබඳ සමීක්ෂණයක්, එස්. ගොඩගේ සහ සමාගම, 1964